# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2328/03 – 2023 අප්‍රේල් මස 18 වැනි අඟහරුවාදා – 2023.04.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2021/97.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.09.15 දිනැති හා අංක 2297/59 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.09.05 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බත්තරමුල්ල, වික්‍රමසිංහපුර, සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය හි ඩී. ඒ. අනිල් නිශාන්ත මයා (ඇතුළු සේවකයින් 14 දෙනා) සහ බත්තරමුල්ල, වික්‍රමසිංහපුර පිහිටි ස්වාධීන රූපවාහිනී සේවය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.03.13 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මාර්තු මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය - කොළඹ

ඩී.ඒ. අනිල් නිශාන්ත මයා ඇතුළු සේවකයින් 14 දෙනා,
සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය,
වික්‍රමසිංහපුර,
බත්තරමුල්ල.

ආරවුල් අංකය: IR/COM/01/2021/97
බේරුම්කරණ අංකය: A /49/2022 පැමිණිලිකරු

එදිරිව:

සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය,
වික්‍රමසිංහපුර,
බත්තරමුල්ල.

2023 මාර්තු මස 13 වැනි දින දී ය. වගඋත්තරකරු

බේරුම්කරණ තීන්දු ප්‍රකාශය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත් කොට මා වෙත යොමුකර ඇත.

**ඉහත සඳහන් පාර්ශවයන් අතර පවතින කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ :**

"සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවයේ සේවකයින් වන ඩී. ඒ. අනිල් නිශාන්ත මයා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 14 දෙනා විසින් ඉල්ලා ඇති,

1. නිසි පරිදි MSD 25 චක්‍රලේඛයට අනුව, එම ශ්‍රේණිවල පිහිටුවීම.
2. නිසි ක්‍රමවේදයකට අනුව, 30/2006 චක්‍රලේඛයේ (MM 1-1) වැටුප් පියවරෙහි පිහිටුවීම.
3. ඊට සමගාමීව හිඟ වැටුප් සහ වරප්‍රසාද ලබාදීමට කටයුතු කිරීම.

යන ඉල්ලීම් ලබා ගැනීමට හිමිකමක් හිමි ද? යන්නත් එසේ හිමිකමක් තිබේ නම් සිදුවී ඇති අසාධාරණය සම්බන්ධයෙන් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් වේ."

එකී හිමිකම් ඉල්ලා සිටින සේවක පිරිස පහත පරිදි වේ:

1. ඩී. ඒ. අනිල් නිශාන්ත මයා
2. පී. බන්දුල ශ්‍රී පද්මලාල් ද සිල්වා මයා
3. අයි. ශ්‍යාමා ප්‍රියදර්ශනී ජයසිංහ මෙය
4. එම්. තයාපරන් මයා
5. කේ. අමරදාස මයා
6. කේ. ඩබ්. කිත්සිරි කුමාර මයා
7. කේ. බී. වී. එස්. කල්‍යානප්‍රිය මයා
8. එම්. ජී. සරත් මයා
9. එම්. අයි. රූපසිංහ මිය
10. ඩී. ඩී. නිශාන්ත මයා
11. වී. මේනුකා ශ්‍රියානි අල්විස් මිය
12. තමරි මහවිතාන මිය
13. ඒ. පී. හෙට්ටිආරච්චි මිය
14. ඩී. ජී. නයනා වික්‍රමසුන්දර මෙය

මෙකී කාර්මික ආරවුල සම්බන්ධයෙන් පැමිණිලිකාර පළමු පාර්ශවය විසින් සිය පළමු විස්තර ප්‍රකාශය සහ වගඋත්තරකාර දෙවන පාර්ශවය විසින් වගඋත්තරකරු විසින් ඉදිරිපත් කරන ප්‍රකාශය 2022.10.04 දින ගොනුකර ඇත.

මෙම බේරුම්කරණ පරීක්ෂණය මා ඉදිරියේ මුල්වරට 2022.10.04 දින කැඳවන ලදී. දෙපාර්ශවයම අතර සමථයක් පවතී දැයි මා විසින් විමසා සිටින ලදුව වගඋත්තරකාර දෙවන පාර්ශවය කියා සිටියේ පැමිණිලිකාර පළමු පාර්ශවය විසින් ඉල්ලා සිටින උක්ත ඉල්ලීම් අතුරින් පළමු සහ දෙවන ඉල්ලීම වන,

1. නිසි පරිදි MSD 25 චක්‍රලේඛයට අනුව, එම ශ්‍රේණිවල පිහිටුවීම.
2. නිසි ක්‍රමවේදයකට අනුව, 30/2006 චක්‍රලේඛයේ (MM 1-1) වැටුප් පියවරෙහි පිහිටුවීම.

යන ඉල්ලීම් සම්බන්ධයෙන් වගඋත්තරකාර ආයතනය විසින් මේ බේරුම්කරණ පරීක්ෂණය ආරම්භ කරන ලද අවස්ථාව වන විට විසඳුම් ලබා දී ඇති බවත්, මෙම පැමිණිල්ලේ ඉල්ලුම්කාර සේවකයින් 14 දෙනා 2020.08.15 වන දින සිට MM- 1 වැටුප් කාණ්ඩයේ පුද්ගලික වන සේ පිහිටුවා ඇති බවත් ය.

ඒ අනුව මෙම බේරුම්කරණ පරීක්ෂණය මගින් විසඳිය යුතු වන්නේ පැමිණිල්ලේ තුන්වන ඉල්ලීම වන,

3. ඊට සමගාමීව හිඟ වැටුප් සහ වරප්‍රසාද ලබාදීමට කටයුතු කිරීම.

ට අදාලව හිඟ වැටුප් සහ වරප්‍රසාද සම්බන්ධ ගැටළුව පමණක් බවත් දෙපාර්ශවය විසින් ම එකඟතාවයකට එළඹෙන ලදී. ඒ අනුව දෙපාර්ශ්වයේ එකී එකඟතාවය අනුව පළමු සහ දෙවන ඉල්ලීම් මේ වන විටත් ලබා දී ඇති බැවින් මෙම පරීක්ෂණයේ දී මා විසින් සලකා බලනු ලබන්නේ තුන් වන ඉල්ලීම සම්බන්ධයෙන් පමණි.

මෙම පරීක්ෂණයේ පැමිණිලිකාර 7 වන ඉල්ලුම්කරු වන කේ. බී. වී. එස්. කල්‍යානප්‍රිය මහතා විසින් 2022.11.01 දිනැති ව ලිපියක් ඉදිරිපත් කරමින් දන්වා ඇත්තේ ඔහු මෙම පරීක්ෂණය ආරම්භ කරන අවස්ථාව වන විට විශ්‍රාම ලබා ඇති බවත් මෙකී කාර්මික ආරවුලේ පාර්ශවකරුවෙකු ලෙස සහභාගී නොවන බවත් ය.

ඒ අනුව 7 වන ඉල්ලුම්කරු සිය අයිතිවාසිකම් අත්හැර ඇති බැවින් පළමු පාර්ශ්වයේ පැමිණිලිකාර සේවකයින් 14 දෙන අතුරින් ඉතිරි සේවකයින් 13 දෙනාට පමණක් අදාලව මෙම පරීක්ෂණ කටයුතු සිදුකරන ලදී.

<u>කාර්මික ආරාවුලේ පසුබිම</u>

වගඋත්තරකාර සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය සම්පූර්ණ රාජ්‍ය හිමිකාරිත්වයක් ඇති රාජ්‍ය ව්‍යවසායක් වන අතර සියලුම රාජ්‍ය ව්‍යවසායන් රජය විසින් පනවනු ලබන නියමයන් අනුගමනය කිරීමට බැඳී සිටී.

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සේවක වැටුප් සංශෝධනය කිරීම සඳහා 2004.12.27 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2004 යටතේ 2004.12.01 දින සිට ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 25 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 යටතේ 2006.01.01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි වැටුප් සංශෝධනය කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නියම කර ඇති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 යන චක්‍රලේඛවල සඳහන් නියමයන් පරිදි වගඋත්තරකාර සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය නිසි පරිදි කටයුතු නොකිරීම නිසා පැමිණිලිකාර සේවකයන් සඳහා දැඩි අසාධාරණයක් සිදුවී ඇති බව පැමිණිල්ල මගින් කියා සිටී.

වගඋත්තරකාර දෙවන පාර්ශවය වෙනුවෙන් මූලික සාක්ෂි ලබාදුන් සහකාර කළමනාකරු (මානව සම්පත්) පනංගල ආරච්චිගේ පවිත්‍රා සජානි පෙරේරා මහත්මියගේ දිවුරුම් ප්‍රකාශය මගින් පහත කරුණු අනාවරණ කර ඇත.

එකී දිවුරුම් ප්‍රකාශයේ 15 වන ප්‍රකාශය අනුව පහත නම් සඳහන් පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් 10 දෙනා සඳහා 2020.08.15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ට පුද්ගලික වන සේ හිඟ වැටුප් ගෙවීමකින් තොරව MM 1-1 වැටුප් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී ඇත.

1. පී. බන්දුල ශ්‍රී පද්මලාල් සිල්වා මයා (සහකාර ඉංජිනේරු)
2. අයි. ශ්‍යාමා ප්‍රියදර්ශනී ජයසිංහ මෙය (සහකාර ඉංජිනේරු/ඉංජිනේරු (මෙහෙයුම්) වැ.බ)
3. කේ. අමරදාස මයා (සහකාර ඉංජිනේරු)
4. කේ. ඩබ්. කිත්සිරි කුමාර මයා (සහකාර ඉංජිනේරු)
5. එම්. ජී. සරත් මයා (සහකාර ඉංජිනේරු - බාහිර විකාශන)
6. එම්. අයි. රූපසිංහ මිය (සහකාර ගණකාධිකාරි)
7. වී. මේනුකා ශ්‍රියානි අල්විස් මිය (සහකාර ගණකාධිකාරි)
8. තමරි මහවිතාන මිය (උපලේඛන ප්‍රධානී)
9. ඒ. පී. හෙට්ටිආරච්චි මිය (ප්‍රධාන ප්‍රවෘත්ති සංස්කාරක)
10. ඩී. ජී. නයනා වික්‍රමසුන්දර මිය (ජ්‍යෙෂ්ඨ අලෙවි විධායක)

එකී දිවුරුම් ප්‍රකාශයේ 17 වන ප්‍රකාශය අනුව පහත සඳහන් පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් 04 දෙනා MM 1-1 (1- ශ්‍රේණිය) සඳහා නම ඉදිරියෙන් දක්වා ඇති තනතුරට උසස්වීම් ලබා දී ඇති අතර මෙම නිලධාරීන් විසින් JM 1-1 වැටුප් බණ්ඩයේ පිහිට වූ දින සිට MM 1-1 වැටුප් බණ්ඩයේ පිහිටුවීම සඳහා කරන ලද ඉල්ලීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලද බව දක්වා ඇත.

| නම | උසස් කරන ලද තනතුර සහ දිනය |
|---|---|
| 1. ඩී. ඒ. අනිල් නිශාන්ත මයා | ඉංජිනේරු - 2018.05.01 |
| 2. එම්. තයාපරන් මයා | ඉංජිනේරු - 2018.05.01 |
| 3. කේ. බී. වී. එස්. කල්‍යානප්‍රිය මයා (විශ්‍රාමික) | ඉංජිනේරු - 2018.05.01 |
| 4. ඩී. ඩී. නිශාන්ත මයා | ගණකාධිකාරී - 2019.09.01 |

තවද, එකී දිවුරුම් ප්‍රකාශයේ 34 වන ප්‍රකාශය අනුව කාර්මික ආරවුලට අදාල ප්‍රස්තුතය ආයතනයේ බලතල යටතට අයත් නොවන බවත් එය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ වැටුප් කොමිෂන් සභාවේ අනුමැතිය මත ක්‍රියාත්මක වන කටයුත්තක් බවත් ප්‍රකාශකර සිටී.

වැඩිදුරටත් එකී දිවුරුම් ප්‍රකාශයේ 35 ප්‍රකාශය මගින් ඉල්ලා ඇත්තේ කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවට හා ජාතික වැටුප් කොමිෂන් සභාවට පළමු වන පාර්ශ්වයේ ඉල්ලීම ඉදිරිපත් කර ඇති බැවින් ඉහත සඳහන් ආයතන කරනු ලබන නිර්දේශ අනුව දෙවන පාර්ශවයට කටයුතු කිරීමට අවසර ලබා දෙන ලෙසත්, මෙම විෂමතාවය සියලුම සේවකයින්ට සාධාරණ වන ලෙස විසඳා ගැනීමට කටයුතු කිරීමට අවසර ලබා දෙන ලෙසත් වේ.

<u>වගඋත්තරකාර දෙවන පාර්ශවය ලිඛිත දේශනය මගින් ඉදිරිපත් කර ඇති විරෝධතා</u>

වගඋත්තරකාර දෙවන පාර්ශවය විසින් සිය ලිඛිත දේශනයේ 4 වන කරුණ මගින් පහත දැක්වෙන විරෝධතා ඉදිරිපත් කරමින් පැමිණිල්ලේ මූලික සාක්ෂිය ලබාදුන් මෙගොඩගමගේ සරත් යන අයගේ දිවුරුම් ප්‍රකාශය වලංගු දිවුරුම් ප්‍රකාශයක් නොවන බවට කරුණු ඉදිරිපත් කර ඇත. එකී විරෝධතාවය මගින් දක්වා ඇත්තේ එකී දිවුරුම් ප්‍රකාශය,

1. 1895 අංක 9 දරන දිවුරුම් හා ප්‍රතිඥා ආඥා පනතේ 3 වගන්තිය අනුව, 1889 අංක 2 දරන සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 181 වගන්තිය උල්ලංඝනය කරන බැවින්,
2. 1889 අංක 2 දරන සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 183 අ (ඇ) වගන්තිය
3. දිවුරුම් හා ප්‍රතිඥා ආඥා පනතේ 12 (3) වගන්තිය උල්ලංඝනය කිරීමක් වන නිසා වලංගු ප්‍රකාශයක් නොවන බව යි.

ලිඛිත දේශනය මගින් ඉදිරිපත් කර දිවුරුම් ප්‍රකාශයේ පවතින තාක්ෂණික දෝෂ එකී දිවුරුම් ප්‍රකාශය මගින් සාක්ෂියක් ලෙස ප්‍රකාශිත කරුණුවල සන්දර්භයට ඉන් බලපෑමක් නොවේ. මෙකී දිවුරුම් ප්‍රකාශය මගින් මෙගොඩගමගේ සරත් යන අය විසින් පළමු පාර්ශ්වයේ අනෙකුත් ඉල්ලුම්කරුවන් වෙනුවෙන් සාක්ෂි ලබාදෙමින් එකී දිවුරුම් ප්‍රකාශය මගින් ඉදිරිපත් කර ඇති X1 සිට X12 දක්වා වූ ලේඛන දිවුරුම් ප්‍රකාශකගේ දැනීම හා නිරීක්ෂණයට යටත් නොවන බවත් ඔහු විසින් සාක්ෂි දිය හැකි ප්‍රකාශ නොවන බවත් ලෙස ඉදිරිපත් කර ඇති ප්‍රකාශය වගඋත්තරකාර පාර්ශවය විසින් සාක්ෂි මගින් තහවුරු කර නොමැති අතර එය හුදු ප්‍රකාශයක් පමණි.

එකී දිවුරුම් ප්‍රකාශය ලබාදුන් ස්ථානය දිවුරුම් කොමසාරිස්වරයා විසින් සඳහන් කර නොතිබීම මත ම එකී දිවුරුම් ප්‍රකාශයේ ප්‍රකාශිත කරුණු වල සන්දර්භයට කිසිදු බලපෑමක් ඇති නොවන අතර එය හුදෙක් තාක්ෂණික දෝෂයක් පමණි. මෙවැනි තාක්ෂණික දෝෂ මත දිවුරුම් ප්‍රකාශ ප්‍රතික්ෂේප නොකළ යුතු බවට *K.H.S. Pushpadeva vs. Senok Trade Combine Ltd* [SC/HC/LA 02/2014 decided on 04/09/2014 - Bar Association Law Journal 2015 Vol. XXI page 40] නඩුවේ දී Justice Aluwihare,PC විනිසුරුතුමන් විසින් දක්වා ඇත්තේ දිවුරුම් ප්‍රකාශයක පවතින දුර්වලතා සහ අක්‍රමිකතා දිවුරුම් ආඥා පනතේ 9 වෙන වගන්තිය යෙදීමෙන් සුවකළ හැකි තාක්ෂණික ස්වභාවයක් පවතින හෙයින් එමගින් දිවුරුම් ප්‍රකාශයේ වලංගුභාවයට බලපෑමක් නොවන බවයි.

> *"ín conclusion It must be said that the infirmities and irregularities in the affidavit of the petitioner referred to by the Respondent are technical in nature that can be cured by application of Section 9 of the Oaths Ordinance and therefore do not impact on the validity the affidavit."*

තවදුරටත් ඒ මතයම තහවුරු කරමින් *Y.A.N. Nadumali vs. D.N. Bamunusinghe* [SC Appeal No. 224/2017 decided on 10/09/2020] නඩුවේ දී Justice S.Thurairaja, PC විනිසුරුතුමන් විසින් අවධාරණය කර ඇත්තේ "තාක්ෂණික විරෝධයක්" මත පමණක් පාර්ශවයන්ට අධිකරණයේ විභාග වන නඩුව අහිමි නොකළ යුතු බවයි.

> *"I find that it is not dispute that the aforementioned decision has referred to technicalities and had held that merely on the footing of a 'technical objection' a party should not be deprived of his case being heard by Court."*

තවද වගඋත්තරකාර දෙවන පාර්ශවය විසින් පැමිණිලිකාර පළමු පාර්ශ්වයේ මූලික සාක්ෂිය ලෙස ලබාදුන් මෙගොඩගමගේ සරත් යන අයගේ දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කළ අවස්ථාවේ එකී දිවුරුම් ප්‍රකාශය සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් කර නොමැති අතර එකී දිවුරුම් ප්‍රකාශය මත පදනම්ව සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න විමසීම සිදුකර ඇත. ඒ අනුව වගඋත්තරකාර දෙවන පාර්ශවය ප්‍රතිබන්ධනයට ලක්වී ඇත.

ඒ අනුව ඉහත සියලු කරුණු සලකා බැලීමෙන් අනතුරුව වගඋත්තරකාර දෙවන පාර්ශවය විසින් ලිඛිත දේශනයේ 4 වන කරුණ මගින් ඉදිරිපත් කර ඇති විරෝධතාවය නිෂ්ප්‍රභා කරමි.

<u>බේරුම්කරණය මගින් විසඳිය යුතු ප්‍රශ්න</u>

දෙපාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති පළමු ප්‍රකාශ සහ දිවුරුම් සලකා බැලීමෙන් පසු සහ දෙපාර්ශවය විසින් එකඟ වූ පරිදි මෙම බේරුම්කරණය මගින් විසඳීමට ඇති "හිඟ වැටුප් සහ වරප්‍රසාද ලබාදීමට කටයුතු කිරීම" පිළිබඳව සැලකීමේ දී බේරුම්කරණ අධිකරණය විසින් විසඳිය යුතු ප්‍රශ්න කවරේද යන්න පහත පරිදි දක්වා සිටිමි.

1. පැමිණිලිකාර පළමු පාර්ශවයට හිමි වැටුප් පියවරෙහි නියමිත පරිදි පිහිටුවීමට වගඋත්තරකාර දෙවන පාර්ශවය අසමත්වීම හේතුවෙන් පළමු පාර්ශවයට අසාධාරණයක් සිදුවී ඇත් ද.?

2. එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම්, පැමිණිලිකාර පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන්ට හිඟ වැටුප් සහ වරප්‍රසාද ලබාගැනීම සඳහා හිමිකමක් තිබේ ද.?

3. ඉහත 1 සහ 2 යන ප්‍රශ්න සඳහා පිළිතුර "ඔව්" ලෙස ලැබේ නම් එක් එක් ඉල්ලුම්කරුවන් සඳහා ගෙවිය යුතු හිඟ වැටුප සහ වරප්‍රසාද කවරේ ද?

ඉහත විසඳිය යුතු ප්‍රශ්න සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් ගොනුකර ඇති ලිඛිත දේශන, අමුණා ඇති ලිපි ලේඛන, ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශ සහ සාක්ෂි සියල්ල සම්පිණ්ඩනය කිරීමෙන් පහත පරිදි තීරණයන්ට එළඹෙන ලදී.

**1. පැමිණිලිකාර පළමු පාර්ශවයට හිමි වැටුප් පියවරෙහි නියමිත පරිදි පිහිටුවීමට වගඋත්තරකාර දෙවන පාර්ශවය අසමත්වීම හේතුවෙන් පළමු පාර්ශවයට අසාධාරණයක් සිදුවී ඇත් ද?**

වගඋත්තරකාර දෙවන පාර්ශවය විසින් 2021 ඔක්තෝබර් 04 දිනැතිව ඉදිරිපත් කර ඇති වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශයෙහි අංක 08 යටතේ ආයතනය විසින් වැටුප් විෂමතාවය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග යනුවෙන් දක්වා ඇති කරුණු පිළිබඳව අවධානය යොමු කරමි.

එකී ප්‍රකාශයේ V8 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති වගඋත්තරකාර ආයතනයේ සාමාන්‍යාධිකාරී විසින් 2020.09.07 සහ අංක ITN/ GEN/1010 (2) දරන "සහකාර ඉංජිනේරුවන්ගේ වැටුප් විෂමතාවය" මැයෙන් තොරතුරු හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලද ලිපියේ මෙසේ දක්වා ඇත.

". . මෙම විෂමතාවය දැඩි ලෙස බලපා ඇත්තේ V වන ශ්‍රේණියේ (JM 1-1 වැටුප් බණ්ඩයේ) විධායක නිලධාරීන්ටය. මක් නිසාද යත් ඔවුන්ට ලබා දී ඇති Jm 1-1 වැටුප් බණ්ඩයේ "ජ්‍යෙෂ්ඨ නිලධාරී" ගණයට ඇතුල් නොවන බැවිනි. නමුත් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සමාන තනතුරුවලට MM 1-1 වැටුප් බණ්ඩය ලබා දී ඇති අතර, මෙය "ජ්‍යෙෂ්ඨ නිලධාරී" ගණයට ඇතුළත් වේ.

"මෙම කාර්ය මණ්ඩලය ආයතනයේ ක්‍රියාකාරී කටයුතු වල යෙදෙන අතර, මෙලෙස ඔවුන්ගේ තනතුරු වලට JM 1-1 වැටුප් බණ්ඩය ලබා දීමෙන් අසාධාරණයක් සිදු වී ඇති බව ද නිරීක්ෂණය වේ".

ඒ අනුව එකී ලිපිය මගින් වගඋත්තරකාර ආයතනය විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ට වැටුප් විෂමතාවයක් සිදුවී ඇති බවට නිර්දේශයක් ලබාදීමෙන් එකී විෂමතාවය පිළිගෙන ඇත.

එකී ප්‍රකාශයේ V9 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති විෂය භාර අමාත්‍යංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් 2020.09.11 සහ අංක MMI/5/7/ITN/2 දරන "සහකාර ඉංජිනේරුවන්ගේ වැටුප් විෂමතාවය - ස්වාධීන රූපවාහිනී සේවය" මැයෙන් කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යවන ලද ලිපිය මගින් ඉහත V8 ලිපිය මගින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම නිර්දේශ කර ඇත.

එකී ප්‍රකාශයේ V13 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති වගඋත්තරකාර ආයතනයේ සමාන්‍යාධිකාරී විසින් 2021.11.15 සහ අංක ITN/GEN/1010 (2) දරන "සහකාර ඉංජිනේරුවන්ගේ වැටුප් විෂමතාවය - සී/ස ස්වාධීන රූපවාහිනී සේවය" මැයෙන් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මගින් ජාතික වැටුප් කොමිෂන් සභාවේ ජේෂ්ඨ සහකාර ලේකම් වෙත යවන ලද ලිපියේ මෙසේ දක්වා ඇත.

"ඉහත JM 1-1 වැටුප් බණ්ඩයේ සිටින විධායක ශ්‍රේණියේ නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුප් විෂමතාවය සම්බන්ධයෙන් ඉල්ලා ඇති ඉල්ලීම් සලකා බලා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ඔවුන්ගේ තනතුරු නාමයේ වෙනසක් සිදු නොකර ඔවුන්ට පුද්ගලික වන සේ හිඟ වැටුප් ගෙවීමකින් තොරව MM 1-1 වැටුප් බණ්ඩයේ 2020.08.15 දින සිට පිහිටුවා ඇත."

ඒ අනුව වගඋත්තරකාර ආයතනය මා විසින් බේරුම්කරණ පරීක්ෂණය ආරම්භ කරන අවස්ථාව වන විටත් පැමිණිලිකාර පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන් හිඟ වැටුප් රහිතව අදල වැටුප් බණ්ඩයේ පිහිටුවීමට කටයුතු කර ඇත.

වගඋත්තරකාර සී/ස ස්වාධීන රූපවාහිනී සේවය වෙනුවෙන් දිවුරුම් ප්‍රකාශයක් මගින් මූලික සාක්ෂිය ලබාදුන් සහකාර කළමණාකරු (මානව සම්පත්) පනංගල ආරච්චිගේ පවිත්‍රා සජානි පෙරේරා යන අයගේ දිවුරුම් ප්‍රකාශය මගින් ප්‍රකාශිතව පිළිගෙන ඇති පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරමි.

එකී දිවුරුම් ප්‍රකාශයේ 15 ප්‍රකාශය මගින් මෙසේ දක්වා ඇත.

> "පහත සඳහන් පළමු පාර්ශවය පැමිණිලි, අභියාචනා සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ද කරුණු දක්වා ඇති අතර වැටුප් විෂමතාවය සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත්කර ඇති ඉල්ලීම සම්බන්ධයෙන් සලකා බලා අදල සේවකයන්ට සිදුවී ඇති අසාධාරණයත් ආයතනයේ කටයුතු බාධාවකින් තොරව කරගෙන යාමත් යන කරුණු සැලකිල්ලට ගෙන පහත සඳහන් සේවකයින් 10 දෙනාට 2020.08.15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඔවුන්ට පුද්ගලික වන සේ හිඟ වැටුප් ගෙවීමකින් තොරව MM 1-1 වැටුප් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමි වී ඇත."

එකී දිවුරුම් ප්‍රකාශයේ 17 ප්‍රකාශය මගින් මෙසේ දක්වා ඇත.

> "තවද පහත සඳහන් පැමිණිලිකරුවන් MM 1-1 (1 ශ්‍රේණිය) ට ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති තනතුරට මේ වන විට උසස් කර ඇත.......
>
> ........ මෙම නිලධාරීන්ටද JM 1-1 වැටුප් බණ්ඩයේ පිහිට වූ දින සිට MM 1-1 වැටුප් බණ්ඩයේ පිහිටුවීම සඳහා කරන ලද ඉල්ලීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලද බව ප්‍රකාශ කර සිටිමි".

එකී දිවුරුම් ප්‍රකාශයේ 20 ප්‍රකාශය මගින් මෙසේ දක්වා ඇත:

> "කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව හා ජාතික වැටුප් හා සේවා කොමිෂන් සභාව නියෝජනය කරමින් මහා භාණ්ඩාගාරයේ එක් නිලධාරියෙක් ආයතනයේ අධ්‍යක්ෂවරයෙක් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සිටින බව ප්‍රකාශ කර සිටිමි."

ඉහත දිවුරුම් ප්‍රකාශයේ ප්‍රකාශිත කරුණු අනුව නිශ්චිතවම ගම්‍ය වනුයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව, ජාතික වැටුප් කොමිෂන් සභාව සහ මහා භාණ්ඩාගාරය නියෝජනය කරනු ලබන නිලධාරීන්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ද මෙම පැමිණිල්ලේ ඉල්ලුම්කාර සේවකයින්ට හිමි වැටුප් පියවරෙහි නියමිත පරිදි පිහිටුවීමට අපොහොසත් වීම මත අසාධාරණයක් සිදු වී ඇති බව පිළිගෙන ඇත.

ඉහත සියලු කරුණු සලකා බලා පැමිණිලිකාර පළමු පාර්ශවයට හිමි වැටුප් පියවරෙහි නියමිත පරිදි පිහිටුවීමට වගඋත්තරකාර දෙවන පාර්ශවය අසමත්වීම හේතුවෙන් පළමු පාර්ශවයට අසාධාරණයක් සිදුවී ඇති බවට තීරණය කරමි.

2. එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම්, පැමිණිලිකාර පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන්ට හිඟ වැටුප් සහ වරප්‍රසාද ලබාගැනීම සඳහා හිමිකමක් තිබේ ද?

පැමිණිලිකාර පළමු පාර්ශව විසින් ලිඛිත දේශනය මගින් ඉදිරිපත් කර ඇති පහත කරුණු පිළිබඳව අවධානය යොමු කරමි.

'' හිඟ වැටුප් ගෙවීමකින් තොරව යනුවෙන් ප්‍රකාශ කිරීමෙන්ම 30/2006 චක්‍රලේඛය ක්‍රියත්මක කළ දින සිට එකී MM 1-1 වැටුප් තලය මෙම සියලු ඉල්ලුම්කරුවන්ට හිමි විය යුතු බව ගම්‍ය වේ. ඒ කෙසේ නමුත් රජය විසින් නිකුත් කළ චක්‍රලේඛය නිසි දින වකවානු තුළ දී ක්‍රියත්මක කිරීම පැහැර හැර එය පසු අවස්ථාවක දී ක්‍රියාත්මක කරන්නේ නම් එහි ප්‍රමාදය සිදුවන්නේ සේවායෝජක පාර්ශවයේ දුර්වල පරිපාලනය තුලින් සිදුවන ක්‍රියාදාමයක් වන බැවින් එහි ප්‍රමාදය සේවායෝජක බාරගෙන චක්‍රලේඛනයේ ප්‍රකාර ප්‍රතිලාභ සේවකයාට නීතියෙන් හිමි තත්ත්වය මත මෙම ඉල්ලුම්කරුවන් 30/2006 චක්‍රලේඛනයට අනුගතව MM 1 - 1 වැටුප් තලය හිමි වන දින සිට හිඟ වැටුප් ගෙවීමට වගඋත්තරකරු නීතියෙන් බැඳී සිටින බැව් ගරු උගත් අධිකරණය සාධාරණ යුක්ති මූලධර්ම අනුව පිළිගන්නවා ඇත.''

පැමිණිලිකාර පාර්ශවය විසින් ඉදිරිපත් කර ඇති නෛතික තර්කය සාධාරණ හා යුක්තිසහගත වේ. සේවායෝජකයාගේ පරිපාලන දුර්වලතා නිසා සේවකයන්ට ලැබිය යුතු හිමිකම් අහිමි විය යුතු නොවේ.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් 2023.01.04 දින සාක්ෂි ලබාදුන් කළමනාකරණ සේවා දෙපර්තමේන්තුව නියෝජනය කරමින් එහි පර්යේෂණ නිලධාරී එස්. එම්. එම්. ඩී. සමරසේකර මහතාගෙන් හරස් ප්‍රශ්න විමසීමේ දී ලබාදුන් සාක්ෂි පිළිබඳව අවධානය යොමු කරමි.

'' ප්‍ර : A5 කියන්නේ 2006.09.22 වන දින යටතේ 30/2006 චක්‍රලේඛනය නිකුත් කිරීම සම්බන්ධයෙන් උපදෙස් නේ ද?
පි : ඔව්

ප්‍ර : 30/2006 චක්‍රලේඛය ක්‍රියාත්මක කරන්න කියලා තියේන්නේ 2006.01.01 වන දින සිට ?
පි : නිවැරදි.''

'' ප්‍ර : ඒ අනුව වගඋත්තරකාර අයතනය සී/ස ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය 30/2006 චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසු තමාගේ ආයතනයේ සේවකයින් කාණ්ඩගත කරලා සම්මුඛ පරීක්ෂණ පවත්වලා ඒ ඒ තනතුරුවල පිහිටුවලා එවපු කාණ්ඩගත කිරීමක් මුල්වරට එවලා තිබෙන්නේ කවදා ද?
පි : මුල්වරට එවපු එක ගැන මගේ මතකයේ නැහැ. කාණ්ඩගත කිරීම මේ වෙන කොට අවසන් වෙලා තියෙනවා. බඳවාගැනීමේ පටිපාටි 90% ක් අවසන් කරලා තිබෙනවා.

ප්‍ර : 2006 සිට අද දක්වා මේ වගඋත්තරකරු 30/2006 චක්‍රලේඛය ක්‍රියාත්මක කරන්න වසර කීයක් කල් මරලා තිබෙනවාද ?
පි : 2006 සිට මේ දක්වා

ප්‍ර : මහත්මයාලා දීල තිබෙන චක්‍රලේඛ උපදෙස් තුළින් ඒ ඒ සේවකයින්ට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමිවීම සේවකයන්ට කරන අසාධාරණයක් බව මහත්මයා සාධාරණ යුක්තිය අනුව පිළිගන්නවාද?
පි : පිළිගන්නවා

ප්‍ර : ව්‍යවස්ථාපිත ආයතන රාජ්‍ය අයතන මේ වගඋත්තරකාර ආයතනය ඇතුළු කිසිම ආයතනයකට මහත්මයාලගේ ආයතනය විසින් නිකුත් කරන කළමනාකරණ චක්‍රලේඛවලට පටහැනිව කටයුතු කරන්න බැහැ නේද?
පි : බැහැ

ප්‍ර : 30/2006 චක්‍රලේඛය ගත්තොත් ඒ චක්‍රලේඛය ක්‍රියාත්මක කරන්න කියලා මහත්මයාලා නියෝග කළේ 2006.01.01 දින සිට නේද ?
පි : ඔව්.

ප්‍ර : එය ක්‍රියාත්මක නොකළා නම් ඒ ඒ වගකීම ඒ ඒ ආයතනය භාරගත යුතු බව පිළිගන්නවා ද ?
පි : පිළිගන්නවා.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් පර්යේෂණ නිලධාරී එස්. එම්. ඩී. සමරසේකර මහතාගේ සාක්ෂිය අනුව 30/2006 චක්‍රලේඛය නිසි පරිදි ක්‍රියාවේ නොයෙදවීම නිසා පැමිණිලිකරුවන්ට අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගෙන ඇත. තවදුරටත් එකී අසාධාරණය 30/2006 චක්‍රලේඛය ක්‍රියාත්මක කළ යුතු දිනය වන 2006.01.01 දින සිට සිදු වී ඇති බව නිශ්චිතවම තහවුරු වේ.

වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් 2023.01.04 දින සාක්ෂි ලබාදුන් ජාතික වැටුප් කොමිෂන් සභාව නියෝජනය කරමින් එහි සහකාර ලේකම් ඩබ්ලිව්. පී. සුරවීර මහත්මිය ලබාදුන් සාක්ෂි පිළිබඳව අවධානය යොමු කරමි:

''ප්‍ර : JM 1 - 1 වැටුප් කාණ්ඩයේ ඉන්න නිලධාරීන්ට එම JM 1 - 1 වැටුප් කාණ්ඩය ලබාදුන් දින සිට පෙරදතම කර MM 1 - 1 වැටුප් කාණ්ඩය ලබාදෙන්න පුළුවන්ද ?

පි : JM වැටුප් කේතය ලබාදීම තීරණය වුණේ පොදු චක්‍රලේඛයක් අනුව කළමනාකරණ සේවා 30 අනුව. ඒක ස්වාධීන රූපවාහිනී සේවයට වගේම ඉතිරි ව්‍යවස්ථාපිත සියලුම ආයතනවලට බලපානවා. ඒ අනුව එම වැටුප් ලබාදීපු තවත් තනතුරු වෙනත් ආයතනවලත් පවතිනවා. ඔබ කියපු කරුණට එකඟවීමේ දී අනිකුත් ආයතනවලත් වැටුප් විෂමතාවයක් ඇතිවීමේ අවස්ථාවක් තිබෙනවා. ඒ නිසා ඒ කරුණට එකඟ වෙන්න අමාරුයි.

ප්‍ර : හිඟ වැටුප් ලබාදෙන්න පුළුවන්ද?

පි : වැටුප් කොමිෂන් සභාව තීරණ ගන්නේ කොමිෂන් සභාවේ සාමාජිකයන් 15 ක් එකතුවෙලා. පෙරදතම කිරීම හෝ එවැනි කරුණකට අවශ්‍ය කරුණු කොමිෂන් සභාවට ඉදිරිපත් කරලා තීරණයක් ගන්න ඕනේ . නමුත් ඒ වගේ හිඟ වැටුප් ගෙවීමකට එකඟ වෙන්න එහෙම කරන්න වුණොත් ඉතිරි සියලුම ආයතන වෙතත් ඒ දේ ලබාදෙන්න වෙනවා. ඒක නිසා ඒ කරුණට එකඟ වෙන්න අමාරුයි.''

මෙහි දී ජාතික වැටුප් කොමිෂන් සභාවේ මතය දක්වමින් සාක්ෂිකාරිය විසින් ප්‍රකාශ කරනු ලබන්නේ මෙම පැමිණිල්ලේ ඉල්ලුම්කරුවන්ට හිඟ වැටුප් ලබාදීම නිසා මෙය හා සමාන වැටුප් විෂමතා අසාධාරණයන්ට ලක්වූ අනෙකුත් ආයතනවලට සේවකයන්ටත් එය පූර්වාදර්ශයක් ලෙස බලපාන බැවින් එසේ හිඟ වැටුප් ලබාදීමට එකඟ වීමට අපහසු බවයි. එකී ප්‍රකාශය හුදෙක් අනියමාර්ථ ප්‍රකාශයක් ලෙස පෙනී යයි. අනාගතයේ ඇතිවිය හැකියයි තවමත් නිශ්චිතව තහවුරු කළ නොමැති සිදුවීමක් සම්බන්ධයෙන් කල්පිතයක් ගොඩනගා ගනිමින් එකී කල්පිතය හේතුවෙන් අසාධාරණයට ලක්වී ඇති මෙම පැමිණිල්ලේ ඉල්ලුම්කරුවන්ට හිඟ වැටුප් ගෙවා සාධාරණය ඉෂ්ඨ කිරීම අපහසු බව පැවසීම පිළිගත හැකි කරුණක් නොවේ. තවද එකී සාක්ෂිය මගින් ප්‍රකාශ කර සිටින්නේ හිඟ වැටුප් ගෙවීමට ''එකඟ වෙන්න අමාරුයි'' යනුවෙනි. එහි අර්ථයනම් එය සිදු කිරීම අපහසු බව විනා එය සිදුකළ නොහැකි බව නොවේ. එබැවින් හිඟ වැටුප් ගෙවීමට කිසිදු බාධාවක් නොපෙනේ.

තවද, එකී සාක්ෂිකාරිය හරස් ප්‍රශ්න විමසීමේ දී ලබාදී ඇති පහත සාක්ෂි පිළිබඳව අවධානය යොමු කරමි:

''ප්‍ර : තමුන්ව කැඳෙව්වේ වැටුප් හා සේවක කොමිෂන් සභාව වෙනුවෙන් ලේඛන ඉදිරිපත් කරන්න නේද ? තමුන්ගේ ලග නැති ලේඛනයක් කොහොමද තමුන් කියන්නේ ඇති කියලා ?

පි : වැටුප් කොමිෂන් සභාවේ ඒ ලේඛනය අධ්‍යයනය කරලා තියෙනවා.

ප්‍ර : කෝ ඒ ලේඛනය ?

පි : මේ අවස්ථාවේ දී ඒ ලේඛනය මට අධිකරණයට ඉදිරිපත් කිරීමට හැකියාවක් නැහැ.

ප්‍ර : මම තමුන්ට යෝජනා කරනවා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට ලක්වෙච්ච නැති ලේඛනයක් තමුන්ගේ ගොනුවට කිසිසේත් එන්න විදියක් නැහැ කියලා ?

පි : කෙටුම්පත් කරන ලද ලේඛනයක් අප වෙත ඉදිරිපත් වෙලා තියෙනවා.

ප්‍ර : නමුත් අද ඒක ගෙනල්ලා නැහැ කියලද කියන්නේ ?

පි : ඉදිරිපත් කරලා තිබෙනවා. බඳවා ගැනීමේ පටිපාටිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබිලා නැහැ. ඒක නිසා එය අධිකරණයට ඉදිරිපත් කිරීමේ හැකියාවක් නැහැ.''

ඒ අනුව තහවුරු වන්නේ වගඋත්තරකාර ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටි මේ දක්වා වැටුප් හා සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොමැති බවයි. ඒ අනුව අනුමැතිය ලබා ගැනීමට පෙර එකී බඳවා ගැනීමේ පටිපාටියේ වටුප් විෂමතා ඉවත් කර සංශෝධනය කිරීමට කිසිදු නෛතික බාධාවක් නොමැත.

එකී සාක්ෂිකාරිය විසින් හරස් ප්‍රශ්න විමසීමේ දී ලබාදුන් පහත සාක්ෂිය පිළිබඳව අවධානය යොමු කරමි:

''ප්‍ර : ...මම ඇහුවේ මූලික අයිතිවාසිකම් යටතේ විධායක තත්ත්වයේ සිටින කෙනෙක්ව විධායක නොවන මට්ටමට පහත හෙලන්න පුලුවන්ද කියලා ආයතනයට ?
පි : පිළතුරක් නැත.

ප්‍ර : මම යෝජනා කරනවා තමුන්ලාට තිබෙන අයිතිය තමයි ඒ ආයතනවලින් ඒ ආයතන ව්‍යුහය සහ බඳවා ගැනීමේ පටිපාටිය නිසි පරිදි සකස් කරලා එච්චහම චක්‍රලේඛ ප්‍රකාරව රටේ අනෙකුත් ආයතනවලට සමගාමීව වැටුප් තීරණය කිරීම කියලා?
පි : පිළිගන්නවා.

ප්‍ර : තමුන් දන්නවාද මෙම ITN ආයතනය ජනමාධ්‍ය අමාත්‍යාංශයට අයත් එකක් කියලා ?
පි : දන්නවා.

ප්‍ර : ජනමාධ්‍ය අමාත්‍යංශයේ ශ්‍රී ලංකා රූපවාහිනී සේවය කියලා එකකුත් තිබෙනවා කියලා දන්නවා ද.?
පි : දන්නවා

ප්‍ර : ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ සේවකයන්ටයි මෙම වගඋත්තරකාර ආයතනයේ සේවකයින්ටයි එක හා සමානව සැලකිය යුතුයි කියලා තමුන් පිළිගන්නවාද වැටුප් ගෙවීමේදී ?
පි : පිළිගන්නවා.''

ඒ අනුව ලබාදී ඇති සාක්ෂි අනුව පැහැදිලිව තහවුරු වනුයේ මේ වන විටත් වගඋත්තරකාර ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටියට වැටුප් හා සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොමැති බවත්, ඔවුන්ට අසාධාරණයක් සිදුවී ඇති බවත්, පැමිණිලිකාර ඉල්ලුම්කරුවන් හට හිඟ වැටුප් නොගෙවීමෙන් සිදුවී ඇති අසාධාරණය සම්බන්ධයෙන් හිඟ වැටුප් ලබාගැනීමට අයිතියක් ඇති බවත් ය.

මෙහිදී ශ්‍රේෂ්ඨාධිකරණය මගින් විනිශ්චිත <u>*Sri Lankan Airlines Limited vs. Sri Lankan Airlines Aircrafts Technicians Association & Others*</u> [SC Appeal No. 79/2013 decided on 12/03/2018] නඩුව කෙරෙහි අවධානය යොමු කරමි.

මෙහි දී ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් 13 වෙනි මාසය සඳහා වන ප්‍රසාද දීමනාව ( The 13 month bonus ) ගෙවීම අත්හිටුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් සමාගමේ ගුවන්යානා කාර්මික ශිල්පීන්ගේ සංගමය විසින් පවරන ලද කාර්මික ආරවුලේ දී බේරුම්කරු ටී. පියසෝම මහතා විසින් ලබාදුන් තීන්දුව සලකා බැලීමක් සිදුකරන ලදී. එහි දී බේරුම්කරුගේ තීරණය වූයේ 13 වෙනි මාසය ලෙස ගෙවනු ලබන ප්‍රසාද දීමනාව හුදෙක්ම ප්‍රසාද දීමනාවක් නොවන බවත් එය සේවකයින් සේවා මුර ක්‍රමයට (roster cylces) රාජකාරී කිරීම නිසා ඔවුන් අතිරේක චන්ද්‍ර මාසයක් සේවයේ යෙදෙන බැවින් එය සේවකයන් විසින් උපයාගන්නා ලද දීමනාවක් බවට තීරණය කර එකී 13 වෙනි මාසය සඳහා වන ප්‍රසාද දීමනාව ගෙවන ලෙසට බේරුම්කරණ තීන්දුව මගින් නියෝග කර ඇත.

ඒ පිළිබඳව වගඋත්තරකාර ශ්‍රී ලංකන් ගුවන් සමාගම අභියාචනාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කළ අතර එකී අභියාචනය ප්‍රතික්ෂේප වූ අතර බේරුම්කරණ නියෝගය එමගින් තහවුරු කරන ලදී. ඉන්පසු වගඋත්තරකාර ආයතනය එකී නියෝගය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ වෙත අභියාචනා කරන ලදී.

එකී නඩුවේ Justice S. Eva Wanasundera PCJ විනිසුරුතුමිය විසින් පහත කරුණු අවධාණය කරමින් තීන්දු කරනු ලැබුවේ බේරුම්කරු විසින් ලබා දී ඇති නියෝගය නිවැරදි බවයි. 13 වෙනි මාසය සඳහා වන ප්‍රසාද දීමනාව යනු සේවකයින් ඒ වන විටත් උපයා ඇති ලැබීමක් වන අතර එය අහිමි කිරීමට වගඋත්තරකාර ආයතනයට නොහැකි බවට එකී නඩුවේ දී තීරණය කරන ලදී.

*"I am of the opinion that this payment which SLAATA had prayed for from the Arbitrator cannot be recognized as a payment on which the employer can use its discretion and avoid payment because it is a payment the employee has earned with his sweat having worked on a roster. The Arbitrator had analysed the evidence before him on the facts and held that it is a right for payment which the members of SLAATA has earned."*

ඉහත නඩු තීන්දුවේ හරය සැලකීමට ගැනීමේ දී මෙම නඩුවේ පැමිණිලිකරුවන් ඉල්ලා සිටින හිඟ වැටුප් යනු ඔවුන් විසින් දූනටමත් උපයාගෙන ඇති වැටුපක් වන අතර එය වගඋත්තරකාර ආයතනය මගින් ලබාදෙන ප්‍රසාද දීමනවක් නොවේ. එබැවින් ඔවුන් විසින් දූනටමත් උපයාගෙන ඇති වැටුප නොගෙවා සිටීමට වගඋත්තරකාර ආයතනයට හිමිකමක් නොමැත. ඒ අනුව පැමිණිලිකාර පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරුවන්ට හිඟ වැටුප් සහ වරප්‍රසාද ලබාගැනීම සඳහා හිමිකමක් තිබෙන බවට තීරණය කරමි.

**3. ඉහත 1 සහ 2 යන ප්‍රශ්න සඳහා පිළිතුර ' ඔව් ' ලෙස ලැබේ නම් එක් එක් ඉල්ලුම්කරුවන් සඳහා ගෙවිය යුතු හිඟ වැටුප සහ වරප්‍රසාද කවරේ ද ?**

ඉහත 1 සහ 2 යන විසඳිය යුතු ප්‍රශ්න සඳහා පිළිතුර 'ඔව්' ලෙස තීරණය කර ඇති නිසා එක් එක් ඉල්ලුම්කරුවන් සඳහා ගෙවිය යුතු හිඟ වැටුප සහ වරප්‍රසාධ කොපමණ මුදලක් ද යන්න පැමිණිලිකාර පාර්ශ්වය විසින් සිය ලිඛිත දේශනය සමග වැටුප් සසඳා ඉදිරිපත් කර ඇති ලේඛන සැලකීමෙන් පහත පරිදි දක්වා සිටිමි.

| | ඉල්ලුම්කරුගේ නම | හිඟ වැටුප (රු.) | හිඟ දීමනා (රු.) | ගෙවිය යුතු සම්පූර්ණ මුදල (රු) |
|---|---|---|---|---|
| 1. | ඩී. ඒ. අනිල් නිශාන්ත මයා. | 2,433,939.50 | 247,000.00 | 2,680,939.50 |
| 2. | පී. බන්දුල ශ්‍රී පද්මලාල් ද සිල්වා මයා. | 2,702,955.25 | 543,000.00 | 3,245,955.25 |
| 3. | අයි. ශ්‍යාමා ප්‍රියදර්ශනී ජයසිංහ මෙය. | 2,210,675.75 | 543,000.00 | 2,753,675.75 |
| 4. | එම් තයාපරන් මයා. | 3,961,856.11 | 462,000.00 | 4,423,856.11 |
| 5. | කේ. අමරදාස මයා. | 2,627,634.46 | 303,000.00 | 2,930,634.46 |
| 6. | කේ. ඩබ්. කිත්සිරි කුමාර මයා. | 2,297,906.23 | 462,000.00 | 2,759,906.23 |
| 7. | එම්. පී. සරත් මයා. | 4,152,652.51 | 543,000.00 | 4,695,652.51 |
| 8. | එම්. අයි. රූපසිංහ මිය. | 1,576,102.95 | 484,500.00 | 2,060,602.95 |
| 9. | ඩී. ඩී. නිශාන්ත මයා. | 1,507,763.10 | 461,000.00 | 1,968,763.10 |
| 10. | වී. මේනුකා ශ්‍රීයානි අල්විස් මිය. | 2,765,866.00 | 298,000.00 | 3,063,866.00 |
| 11. | තමරි මහවිතාන මිය. | 2.073,173.00 | 606,000.00 | 2,679,173.00 |
| 12. | ඒ. පී. හෙට්ටිආරච්චි මිය. | 4,362,707.68 | 543,000.00 | 4,905,707.68 |
| 13. | ඩී. පී. නයනා වික්‍රමසුන්දර මෙය. | 3,923,288.26 | 543,000.00 | 4,466,288.26 |

<u>ප්‍රදානය</u> :

පැමිණිලිකාර පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වයේ වගඋත්තරකාර සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි, ලේඛන සහ ගොනු කරන ලද ලිඛිත දේශන සලකා බැලීමෙන් පසුව පහත තීරණයන්ට එළඹියෙමි.

සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවයේ සේවකයින් වන ඩී. ඒ. අනිල් නිශාන්ත මහතා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 13 දෙනා විසින් ඉල්ලා ඇති සහන අතුරෙන් (1.) නිසි පරිදි MSD 25 චක්‍රලේඛයට අනුව එම ශ්‍රේණිවල පිහිටුවීම සහ (2.) නිසි ක්‍රමවේදයකට අනුව , 30/2006 චක්‍රලේඛයේ (MM 1-1) වැටුප් පියවරෙහි පිහිටුවීම මේ වන විටත් වගඋත්තරකාර ආයතනය විසින් සිදුකරනු ලැබ ඇත. ඊට සමගාමීව හිඟ වැටුප් සහ වරප්‍රසාද ලබාදීමට කටයුතු නොකිරීම මගින් මෙම පැමිණිල්ලේ ඉල්ලුම්කරුවන්ට අසාධාරණයක් වී ඇති බව තීරණය කරමි. එකී සේවකයන්ට අදාල ශ්‍රේණියට හිමි වැටුප් තලය ලබා නොදීම යුක්ති සහගත නොවන බවත් ඔවුන්ට හිමි  හිඟ වැටුප සහ හිඟ දීමනා නොගෙවීමෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් කඩ වී ඇති බවත්, හිමිවිය යුතු හිඟ වැටුප් සහ හිඟ දීමනා නොගෙවීම මත මූල්‍යමය මත අවාසියක් සිදු වී ඇති බවත් තීරණය කරමි

ඒ අනුව පහත දක්වා ඇති පරිදි පැමිණිලිකාර ඉල්ලුම්කරුවන්ට පෞද්ගලික වන සේ හිඟ වැටුප් සහ හිඟ දීමනා ගෙවිය යුතු බවට වගඋත්තරකාර සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවයට නියෝග කරමි.

| | ඉල්ලුම්කරුගේ නම | ගෙවිය යුතු සම්පූර්ණ මුදල (හිඟ වැටුප් සහ දීමනා ) (රු.ශ) |
|---|---|---|
| 1. | ඩී. ඒ. අනිල් නිශාන්ත මයා. | 2,680,939.50 |
| 2. | පී. බන්දුල ශ්‍රී පද්මලාල් ද සිල්වා මයා. | 3,245,955.25 |
| 3. | අයි. ශ්‍යාමා ප්‍රියදර්ශනී ජයසිංහ මෙය. | 2,753,675.75 |
| 4. | එම් තයාපරන් මයා. | 4,423,856.11 |
| 5. | කේ. අමරදාස මයා. | 2,930,634.46 |
| 6. | කේ. ඩබ්. කිත්සිරි කුමාර මයා. | 2,759,906.23 |
| 7. | එම්. ජී. සරත් මයා. | 4,695,652.51 |
| 8. | එම්. අයි. රූපසිංහ මිය. | 2,060,602.95 |
| 9. | ඩී. ඩී. නිශාන්ත මයා. | 1,968,763.10 |
| 10. | වී. මේනුකා ශ්‍රීයානි අල්විස් මිය. | 3,063,866.00 |
| 11. | තමරි මහවිතාන මිය. | 2,679,173.00 |
| 12. | ඒ. පී. හෙට්ටිආරච්චි මිය. | 4,905,707.68 |
| 13. | ඩී. ජී. නයනා වික්‍රමසුන්දර මෙය. | 4,466,288.26 |
| ගෙවිය යුතු සම්පූර්ණ මුදල. | | 42,635,020.80 |

මෙකී සම්පූර්ණ වන්දි මුදල වන රුපියල් හතිලිස් දෙක මිලියන හයසිය තිස්පන් දහස් විස්සයි ශත අසූවක (රු. 42,635,020.80) මුදල පැමිණිලිකාර පළමු පාර්ශ්වය වන ඉහත නම් සඳහන් සේවකයන් වෙනුවෙන් මෙම නියෝගය ගැසට් පත්‍රයේ පළ වී දින 30 ක් ඇතුළත සහකාර කම්කරු කොමසාරිස් නැගෙනහිර කොළඹ කම්කරු කාර්යාලය වෙත ගෙන මෙන් දෙවන පාර්ශ්වයේ වගඋත්තරකාර ආයතනය වන සීමාසහිත ස්වාධීන රූපවාහිනී සේවයට මෙයින් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්තිසහගත තීරණයක් බවට තීරණය කරමි.

නීතිඥ පියල් දර්ශන ගුරුගේ
බේරුම්කරු

2023.03.13

EOG 04 - 0103

---

*මගේ අංකය*: IR/COM/04/2020/84.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2022.06.18 දිනැති හා අංක 2284/64 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.06.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1. අකුරැස්ස, හේනේගම, ''ශාන්ති ''හි පදිංචි සුනිල් ලියනගමගේ මයා 2. කොළඹ 09, දෙමටගොඩ, මිහිඳුසෙත්පුර, අංක 1AF2U22 හි පදිංචි පී. පී. ආර්. ප්‍රනාන්දු මයා සහ කොළඹ 03, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය, අංක 10, ප්‍රින්ස් ඇල්ෆ්‍රඩ් කුළුණ, 3

වන මහල හි පිහිටි ශ්‍රී ලංකා ට්‍රේඩිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.02.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මාර්තු මස 28 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

බේරුම්කරු :- නීතිඥ කේ. පී. ඩී. ගුණරත්න මහතා ඉදිරිපිට දී යි

01. සුනිල් ලියනගමගේ මයා,
''ශාන්ති'' ,හේනේගම,
අකුරැස්ස.

02. පී ප්‍රියන්ත රවීන්ද්‍ර ප්‍රනාන්දු,
අංක 1AF2U22,
මිහිඳු සෙන්පුර, දෙමටගොඩ
කොළඹ 09.

*පළමු පාර්ශ්වය*

*නඩු අංක:* A/27/ 2022.
යොමු අංකය: IR/COM/04/2020/84.

**සහ**

ශ්‍රී ලංකා ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්.
03 වන මහල, ප්‍රින්ස් ඇල්ෆ්‍රඩ් කුළුණ,
අංක 10, ඇල්ෆ්‍රඩ් හවුස් උද්‍යානය,
කොළඹ 03.

*දෙවන පාර්ශ්වය*

ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරණ පනත් වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත දැක්වෙන කාර්මික ආරාවුලට හේතු පාදක වී ඇත්තේ ශ්‍රී ලංකා ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සේවක සුනිල් ලියන ගමගේ මහතා සහ පී. පී. ආර්. ප්‍රනාන්දු මහතා යන දෙදෙනා හට පවත්වන ලද විනය පරීක්ෂණය අවසන් නොකර තීරණයක් ලබා නොදී දීර්ඝ කාලයක් තබා ගැනීම මගින් අසාධාරණයක් සිදු වී තිබේද? සිදුව තිබේ නම්, දෙදෙනා හට වෙන් වෙන් වශයෙන් හිමි විය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.

මෙම බේරුම්කරණය වර්ෂ 2022.08.08 වන දින ආරම්භ කරන ලද අවස්ථාවේ දී දෙපාර්ශ්වයෙන්ම කරන ලද ලිඛිත සැලකිරීම් සැලකිල්ලට ගෙන දෙපාර්ශ්වය අතර සමථයක් ඇති වීම, වඩා යෝග්‍ය බව පෙන්වා දීමෙන් පසු නැවත 2022.09.14 වන දින පළමු පාර්ශවය විසින් සමථ යෝජනා ඉදිරිපත් කරන ලදුව, එම යෝජනා සලකා බැලීම දෙවන පාර්ශ්වය විසින් 2022.09.26, 2022.11.04, 2022.12,02, 2023.01.02 සහ 2023.02.09 යන දින ලබාගත අවසාන වශයෙන් 2023.02.28 වන දින දෙපාර්ශ්වය විසින් එකග වන ලද සමථ යෝජනා ද්විතව මා වෙත ඉදිරිපත් කොට මෙම බේරුම්කරණ ආරාවුල සමථයකට පත් කරන ලදුව, පහත සඳහන් පරිදි ප්‍රදානය ලබා දෙන ලදී.

01. දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයේ සුනිල් ලියන ගමගේ යන අය සඳහා,

(i) එකී අයගේ රැකියාවට අදාළව ගෙවිය යුතු සියලු හිග වැටුප් සහ අනෙකුත් ගෙවීම් වශයෙන් රුපියල් තුන්ලක්ෂ තිස්දහස (රු. 330,000/-) ක මුදලක් ද,

(ii) එකී අයගේ සම්පූර්ණ සේවා කාලය සඳහා පාරිතෝෂික වශයෙන් තුන්ලක්ෂ තිස්දහස (රු. 330,000/-) ක මුදලක් ද,

(iii) පාරිතෝෂික අධිභාරය වශයෙන් රුපියල් අනූනව දහස (රු.99,000/-) ක මුදලක් ද ගෙවීමටත්,

01. දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයේ පී. ප්‍රියන්ත රවීන්ද්‍ර ප්‍රනාන්දු යන අය සඳහා,

(i) එකී අයගේ රැකියාවට අදාළව ගෙවිය යුතු සියලු හිග වැටුප් හා අනෙකුත් ගෙවීම් වශයෙන් රුපියල් හාර ලක්ෂ හැට හතර දහස (රු.464,000/-) ක මුදලක් ද,

(ii) එකී අයගේ සම්පූර්ණ සේවා කාලය සඳහා පාරිතෝෂික වශයෙන් රුපියල් පනස් හත්දහස් හත්සිය පනහ රු.57,750/- ක් ද,

(iii) පාරිතෝෂික අධිභාරය වශයෙන් රුපියල් දාහත්දහස් තුන්සිය විසිපහය (රු.17,325/-) ක් ගෙවීමටත්,

මෙම ගෙවීම් පළමු පාර්ශ්ව සහ දෙවන පාර්ශ්වය අතර, පූර්ණ හා අවසානාත්මක සමථයක් වශයෙන් ගෙවනු ලැබීමටත්, ඉහත කී මුදල් වර්ෂ 2023.03.14 වන දින හෝ ඊට පෙර පළමු පාර්ශ්වයේ සුනිල් ලියනගම සහ පී. ප්‍රියන්ත රවීන්ද්‍ර ප්‍රනාන්දු යන අයගේ ඒ ඒ බැංකු ගිණුම් වලට තැන්පත් කිරීමටත් එකඟව පළමු පාර්ශ්වය සහ දෙවන පාර්ශ්වය මෙම සමථය පිළිගන්නා බවටත්, එකඟ වන අතර, ඉහත කී පරිදි දෙවන පාර්ශ්වය ක්‍රියා නොකළහොත්, පළමු පාර්ශ්වයට මෙම නඩුව මෝසමක් මගින් කැඳවීමට හැකි බවටත්, එමගින් සමථය ප්‍රකාර ක්‍රියා කිරීම සඳහා දෙවන පාර්ශ්වයෙන් ඉල්ලා සිටීමට පළමු පාර්ශ්වය අයිතිය ඇති බවටත් වැඩිදුරටත් එකඟ වනු ලැබ, ඒ අනුව පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය මා ඉදිරිපිට සමථයට එළැඹෙන ලදුව පලමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය මා ඉදිරිපිට සිය අත්සන් තබන ලදි.

මෙම ආරාවුලෙහි දෙවන පාර්ශ්වය විසින් අත්සන තැබූ සමථ වූ සියළු කරුණු සිදු කර ඇති බව අණාවරනය කරගත් අතර පලමු පාර්ශවය විසින් එය සහතික කර ඇත. ඒ අනුව මෙම ආරාවුල නිමා කරමි.

මෙම සමථය සාධාරණ හා යුක්ති සහගත සමථයක් බවටත් මම සහතික කරමි.

කේ. පී. ගුණරත්න,
නීතිඥ.

2023.02.28. දින දීය.

EOG 04 - 0104

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.